සකස් කිරීම : ධනුෂ්ක සෙනවිරත්න.
කෑ/මාව/ගබ්බල සිරිසඟබෝ ම.වි. (මාවනැල්ල කලාපය)

# රබන් පද වාදනය



"රබාන" ශ්‍රී ලාංකීය ජනයාට ඉතා සමීපවූ භාණ්ඩයකි. කොස්, කොහොඹ, සූරිය ආදී දැවයන්ගෙන් ලියවා තනා ගනු ලබන රබන් කදෙහි සණකම අඟල් කාලක් පමණ වන අතර, මුහුණත එළු සමින් හෝ හරක් සමින් නිපදවා ඇත. රබාන මෙරට කලා කරුවන්ගේ නිපදවීමක් යැයි සැලකිය හැකිය. ප්‍රධාන වශයෙන් රබන් වර්ග දෙකකි.

අත් රබාන (විරිඳු රබාන)



බංකු රබාන (මහ රබාන)



රබන් පද වැයීමට උපයෝගී කරගනු ලබන්නේ කනු තුනක් මත රැඳවූ බංකු රබානය. බංකු රබාන ගැමි කාන්තාවන් අතර සිංහල අවුරුදු සමයේදී භාවිත වන ප්‍රචලිත භාණ්ඩයකි. මුහුදුබඩ ප්‍රදේශයන්හි මෙන්ම මැද කඳුරට ප්‍රදේශයන්හි ද මංගල අවස්ථාවන්හි මෙන්ම මංගල පූර්ව කටයුතු වලදී ද බංකු රබාන වයනු ලබයි. එමගින් අවට ප්‍රදේශය වෙත එම කටයුත්ත පිළිබඳව සන්නිවේදනයක් ද සිදු වේ. ක්‍රිස්තියානි ආගමික දේවස්ථාන වල කොඩිගස එසවීමේ මංගල්‍යය දින මෙන්ම දේවස්ථාන පෙරහැර අතරතුර දී රබන් පද වැයීම සිරිතකි. කාන්තාවෝ කිහිපදෙනෙක් රබාන වටා වාඩි වී අත්ලෙන් මෙන්ම වැලමිට වැනි ස්ථානයන්ගෙන් ද , ඉරටු වැනි විශේෂ උපකරණ යොදාගෙන ද වාදනය කරති. එමෙන්ම බංකු රබාන වැයීමට සුවිශේෂ වූ අවනද්ධාක්ෂර නැත. කිසියම් පද සමූහයක් ධ්වනියට පෙරළා වැයීම සිදුකරයි. රබන් පද වැයෙන රටාව හඳුනාගත් පසුව රබන් පද නිර්මාණය කළ හැක. දේශීය සංස්කෘතික ලක්ෂණ විදහා දක්වන රබාන මෙන්ම රබන් වාදන කලාව ද ජාතික සම්පතක් ලෙස රැක ගැනීම අප සතු යුතුකමකි.

<u>ඉහත ඡේදය කියවා පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.</u>

1. රබාන සාදන ලී වර්ග ලියා දක්වන්න.
2. රබන් කඳෙහි ඝනකම කොපමණද?
3. රබාන සඳහා යොදාගනු ලබන සම් වර්ග මොනවාද?
4. ප්‍රධාන වශයෙන් රබන් වර්ග කීයද? ඒ මොනවාද?
5. විශේෂයෙන් බංකු රබන් වාදනය කරන්නේ කුමන සමයේදී ද?
6. බංකු රබාන වාදනව කරන අවස්ථා ලියා දක්වන්න.
7. බංකු රබාන වාදනයේ ඇති දක්ෂතා ලියා දක්වන්න.
8. “රබන් වාදනය සන්නිවේදන මධ්‍යයකි” විස්තර කරන්න.